මානවශාස්ත්‍ර අධ්‍යයන, 1999 (1), පිටු 79-87.

# "විලාසිනියකගේ ප්‍රේමය" නම් වූ චම්පු කාව්‍යයෙන් හෙළිවන සමාජ සත්තාව

වසන්ත කේ. දිසානායක

ගැදි වහර හා පැදි වහර ස්ථානෝචිතව යොදාගැනීම තුළින් මනරම් ගැදිකවක් නිමවිය හැකි වගට කදිම සාක්ෂියකි, සරච්චන්ද්‍රයන්ගේ **විලාසිනියකගේ ප්‍රේමය**. සිංහල සාහිත්‍ය ඉතිහාසයේ මෙවන් ගැදිකවක් මෙයට පෙර දක්නට නොලැබුණු අතර සරච්චන්ද්‍රයන් පෙර'පර දෙදිග සාහිත්‍ය මැනවින් හදාරා ඉන් ලද ජීවන පරිඥානය මේ මිශ්‍ර කාව්‍යය නිර්මාණය සඳහා බලපාන්නට ඇත. පෙරදිග සාහිත්‍යයේ මෙවන් මුසු කවි හැඳින්වෙන්නේ "චම්පු" නමිනි. චම්පු කාව්‍ය විග්‍රහ කරන **කාව්‍යාදර්ශකරුවා**

"මිශ්‍රාණි නාටකාදීනි තෙෂා මන්‍යාත්‍ර විස්තරඃ
ගද්‍යපද්‍ය මයිකාච්චචම්පුරිත්‍යභිධියතෙ" යනුවෙන් සඳහන් කරයි.

නාටකාදී කාව්‍යයෝ ගද්‍ය පද්‍ය දෙකින් කරන ලද හෙයින් මිශ්‍ර නම්වෙති. බහුල වශයෙන් ගද්‍ය පද්‍ය දෙකින් කරන ලද ශ්‍රව්‍ය කාව්‍යයන්ට චම්පු යනු නාමාන්තරයකි. ආඛ්‍යායිකාවෙහි දී ස්වල්ප වශයෙන් ගද්‍ය පද්‍ය මිශ්‍රත්වය දක්නට ලැබෙතත් හේ චම්පු නොවේ. ගද්‍ය පද්‍ය සියල්ලම ද චම්පු නොවේ.

"ගද්‍ය පද්‍යමයි රාජස්තුතිර් විරුදමුච්‍යතෙ" උදාහරණයි.[1]

ගද්‍ය පද්‍ය දෙකින් යුක්ත වූ රාජස්තුති විරුදකාව්‍ය නම් වේ. **සියබස්ලකර** නමින් **කාව්‍යාදර්ශයේ** ම සිංහල අනුවර්තනයක් සිදු කළ සේන සලමෙවන් ද "චම්පු" ගැන සටහනක් කොට ඇත. එය මෙසේ ය.

'වතු මැනවි සියබසි - නේකව්බඳ සිරිදු යම්
වදන් පබදෙක්දකියු - පෙදෙන් විසිතුරු සපුයි'

චම්පු යැයි කීවාවූ පද්‍යයෙන් විචිත්‍ර යම් වචන සමූහයක් වේ ද, ඒ කාව්‍යබන්ධනශ්‍රීය ද ස්වකීය වූ සිංහල භාෂාවෙන් වර්ණනාකළ මැනවි.[2] **සියබස්ලකර** රචනා වූ කාලවකවානුව වනවිට චම්පු ආරෙන් ලියවුණු නිර්මාණයක් නොවූ බැවින් **සියබස්ලකර** කරු මෙසේ ප්‍රකාශ කරන්නට ඇතැයි සිතිය හැකිය.

සම්භාව්‍ය ගද්‍ය කාව්‍යයක් වන ජාතක කථා සංග්‍රහයේ එන 'කණවෙර' ජාතකය පාදක කොටගෙන රචනා කොට ඇති **විලාසිනියකගේ ප්‍රේමය** සඳහා සරච්චන්ද්‍රයන් යොදාගෙනෙ ඇති භාෂා රීතිය ඇතැම් විටෙක සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යය ද, තවත් විටෙක නූතන ගද්‍ය සාහිත්‍යය ද පාඨක මනසට සිහිගැන්වේ. සිංහල සාහිත්‍යයේ ජාතක කථා පාදක කොටගෙන ලියැවී ඇති නිර්මාණ කිසිවකට දෙවෙනි නොවන නිර්මාණ කෞශල්‍යයක් මෙම චම්පූ කාව්‍ය තුළින් පිළිබිඹු වේ. ඇතැම් විට දෙළොස්වන සියවසේ දී ගුරුළුගෝමීන් විසින් රචනා කරන ලද **ධම්පියාඅටුවා** **ධම්මප්‍රදීපිකාවේ** එන සුළුකලිඟුදාවතත්, තවත් විටෙක දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන්ගේ **සද්ධර්මරත්නාවලියේ** එන ඇතැම් කථාත් **විලාසිනියකගේ ප්‍රේමය** කියවන විට සිහියට නැගේ. කතුවරයා ඉදිරිපත් කරන කථාපුවතට යටින් දිවෙන සදාතනික සමාජ විචාරණය ද, සමාජ දේශපාලන ක්ෂේත්‍ර දෙස කතුවරයා හෙළන දෘෂ්ටි කෝණය ද සිත්ගන්නා සුළු ය. හැකි සෑම විටකදී ම තමා නිරූපණය කරන චරිතයන්හි මනෝවිද්‍යාත්මක විවරණයක් ද එම චරිතවලට එක්කරන්නේ මහත් කුසලතාවක් පෙන්නුම් කරමිනි. ඒ ඒ චරිත ඒ ඒ අවස්ථාවල දී විවිධත්වයකින් යුතුව ක්‍රියාකරන්නේ මනුෂ්‍ය ස්වභාවය නිසා බැවින්, හුදෙක් චරිතවලට වරද පැටවිය නොහැකිය යන විශ්ව සාධාරණ ලක්ෂණ ද චරිතවලට ලබාදීමට කතුවරයා අමතක නොකරයි.

**විලාසිනියකගේ ප්‍රේමය** නම් වූ චම්පූකාව්‍යයේ ප්‍රධාන චරිතයක් වන සාමා, උත්පත්තියෙන් ම ගණිකාවක් නොවූවා ය. උදේනි පුරයේ මිගසාලා ගණිකාවට රන්මසු දහසකට ඇය වික්කෝ ඇගේ මව්පියෝ ය. මව්පියන් එසේ කළේ දරුදුක පරයමින් කුසගින්න නැගුණු නිසාය. කුසට අහරක් සෙවූ ඔවුහු සාමා ගණිකාවකට විකුණා කුසගිනි නිවාගත්හ. ඉසදින්න උත්පත්තියෙන් ම කවියෙකි. වීණා වාදකයෙකි. එමෙන්ම දුප්පතෙකි. ඔහු සාමාට සේවය කරයි. මනසින් සමාව වැළඳ ගනී, සැබවින් ම වැළඳ ගැනීමට තරම් ශක්තියක් ඔහුට නැත. දුරස්තව සිටිමින් ඔහු ඇයට පෙම් කරයි. උත්තරා සුභද්‍රීලි යටහත් පහත් සේවිකාවකි. අහස උසට වස්තුව තිබුණ ද ජයද්දිස සිටුවරයාට මානසික තෘප්තියක් නැත. ඔහු සිතන්නේ සාමාව මිල දී ගතහැකි භාණ්ඩයක් ලෙසිනි. කාන්තාව වානිජ අර්ථක්‍රමයට හසුව වෙළඳ භාණ්ඩයක් වී ඇත. මිල මුදලට දන නමස්කාර කරන සමාජයක් කතුවරයා පාඨකයා ඉදිරියේ මවා පායි. ගැහැණියක් වෙනුවෙන් රටේ නීතිය උල්ලංඝනය කරන්නෝ එද මෙන්ම අදත් සිටිති. හෙට ද බිහිවෙති. මෙහි ගුත්තසේන එබඳු රාජ්‍ය සේවකයෙකි. රටේ නීතිය ක්‍රියාත්මක කරන්නන්ගේ තත්ත්වය එබඳුනම් නීතිය රකින්නන්ගේ තත්ත්වය කෙබඳු වේ ද? හාරිත දරුණු මිනීමරුවෙකි. ඔහුට, ආදරය ස්නේහය, ප්‍රේමය විහිළුවකි. මායාවකි. ප්‍රේමයෙන් වෙලී දයාබර බිරිඳක් ලබා ස්වාමිපුරුෂයෙක් වීමට ඔහුට අවශ්‍ය නැත. කරුණාව, දයාව, ආදරය වැනි මානව හැඟීම් මිනිස් සිත් තුළින් පලාගොස් ඇත. මේවා පලායාමට හේතු **'විලාසිනියකගේ ප්‍රේමයෙන්'** සාකච්ඡාවට භාජනය කෙරේ. අප රටට, ජාතියට ආගමට සෘජුව ම සබැඳියාවක් නැති ඉතා ඈත භාරත දේශයේ සිදු වූ පුවතක් ඇසුරුකරගනිමින් සරච්චන්ද්‍රයන් සාර්වකාලික සාර්වභෞමික ගුණාංගයන් ගෙන් සමුපේත ඉතා හරවත් ගද්‍ය කාව්‍යක් නිර්මාණය කර ඇත.

ඉසිදින්න කවියා ගී ගයමින් රටපුරා ඇවිදිමින් ජීවත්වන්නෙකි. එදා ඔහු සාමාගේ මැදුරට පැමිණියේ සුපුරුදු පරිදි සාමාට ගී ගයා සතුටු වීමට ය. නමුත් ගී ඇසීමට තරම් සිතක් සාමාට නැත. සාමා කුමන හෝ මානසික අර්බුදයකට ලක්වී ඇති බව පෙනේ. එබැවින් ගී ගැයීම පසෙක

තබා ඔවුහු සතුටු සම්චියේ යෙදෙති. ඉසිදින්න විහිළු කළ ද සාමාට එයින් ද සතුටක් නැත ඇගේ යෙහෙළිය වූ උත්තරා කොක් හඬලා සිනාසෙයි. ඉසිදින්නගේ කවට කථා අසමින් නිහඬව සිටිය නොහැකිව සාමා ද ඔවුන් සමග සිනාසෙයි.

"එකෙනෙහි සාමාවෝ "බකස්" යන අනුකරණයෙන් සිනාසුහ."[3] "බකස්" යන ව්‍යවහාරය වීරන්තන ගද්‍යයෙන් නොව නූතන ව්‍යවහාරයෙන් එකතු කොටගත්තෙකි. "සාමාවෝ" යන ගෞරවාර්ථයෙන් ඔහු සාමාව අමතයි. මේ යෙදුම ස්ථානෝචිත වේ. ඉසිදින්නගේ ගීත විනිශ්චය කරන්නේ සංගීත විශාරදයෙකු නොවේ. රටේ සිටින පමත් ම පෙළේ ගණිකාවක විසිනි වෘත්තියෙන් ගණිකාවක් වුව ද ඇයට රසික හදවතක් ඇත. අවංක නිර්ව්‍යාජ විනිශ්චයක් ඇයට කළ හැක්කේ එබැවිනි. අවංකත්වය නිර්මාණශීලි බව ඇත්තේ සත්මහල් ප්‍රාසාදවල වෙසෙන්නන් ළඟ නොව ගණිකාවන් ළග ය. ඉසිදින්නට පූර්ණ විශ්වාසයක් ඇය කෙරෙහි ඇත.

"ඇ ඉඳුරා තම හැඟීම් ප්‍රකාශ කරනු විනා තමා සතුටු කිරීමේ අධ්‍යාශයෙන් හෝ සිත රිදෙතියි බියෙන් හෝ මායාවක් නොපාන නියාව හේ දනී."[4]

ඉසිදින්න ඇගෙන් ලබන්නේ නිර්වචනීය ආස්වාදයකි. ඉසිදින්නගෙන් සාමා ලබන්නේ ද එබඳුම ආස්වාදයකි. මිනිස් මනසේ සැබෑ ස්වරූපය කතුවරයා පසක් කොට ගෙන සිටී ඉසිදින්නගේ ගායනය සාමාවන්ගේ සියොළඟ ලොමු දැහැ ගැන්වීමට සමත් වේ.

"වසන්ත දෙව්දුව සමුගන්නට යයි.
රුප්පා මුල ඇද හැලේ ය පරමල්
ලොවේ සොඳුර මැලවී නැති වී යන
සමයයි එළඹෙන්නේ"

වසන්ත දෙව්දුව සමුගෙන ගියකල
ලොවේ සොඳුර මැලවී නැතිවුණද
රුප්පාවල විසිරි ඇති පරමල්
කවුද නෙළා ගන්නේ"[5]

ජීවිතය පිළිබඳ ගැඹුරු පතිවිඩයක් මේ ගායනය මගින් ලබාදීමට කතුවරයා සමත් වේ පද සංඝටනාවෙන් නගන රිද්මය සිත්සතන් පුබුදු කිරීමට සමත් වේ. සංවේගාත්මක ස්වරයක් කතුවරයා මෙහි දී යොදාගනී. වසන්ත දෙව්දුව සමුගෙන යාමට පෙර, රුප්පාමුල වැටී මල් පරවී යාමට මත්තෙන්, වසන්ත සමය ගත වී යන්නට පෙර කළයුතු රාජකාරියක් ඇත. ඉසිදින්නගේ මනසේ ප්‍රකාශනයන් සාමාට වටහාගත නොහැකි තරම් ය. ඇයත් ඔහුත් ගීතයෙන් උන්මාදයට පත්වී ඇත.

"හේ ඇසිපිය රෝම අතුරින් සාමාව දිසාවට බැලුම් හෙළී ය. සාමා ද ඔහු දෙස නුවනගින් බලන්නී ඔහුගේ දෘෂ්ටිපථයට හසුවන හැමවිටම විලියෙන් මිරිකෙන්නී ය."[6]

ජයද්දිස සිටුවරයා ඇය මුණගැසීමට පැමිණ ඇතත් ඇයට කම් නැත. සරසවි දේවිය විසින් ඇය අරක් ගෙන ඇත. ජයද්දිස පැමිණීම ඉසිදින්නගේ සතුටට හේතු නොවී ය. එය ඔවුන්ගේ ප්‍රේමාලෝකයට බාධාවකි. ඉසිදින්න කනස්සල්ලට පත්වන්නේ එබැවිනි. ඒ බව.

"එතැන් පටන් ඉසිදින්නයන් ගැයුවේ තම සිතෙහි පෙර තිබූ උද්දාමය මඳව හීනවී ගිය කලක් පරිද්දෙනි. සරසවි දේවිය එක පැහැර ඔහු හැරපියා ගියා සේ විය.[7]

පෙර පැවැති උද්දාමය හීනවී යාමට හේතුව ජයද්දිසගේ පැමිණීමයි. එය ඉසිදින්නට ද නොදනුවත්ව ම සිදු වී ඇත. එසේ ආසක්ත වුව ද ඉසිදින්නට සාමාව සමග සම්භෝගයෙහි යෙදීමට ශක්තියක් නැත. හේතුව සාමාව පතන්නෝ ධන කුවේරයෝ ය. ඉසිදින්න එබඳු ධනවතෙක් නොව කවියෙකි. ඔහු සතු ධනය කලාවයි. කලාවට එවන් ලොවකට ලංවීමට ශක්තියක් නැත. නමුත් කලාලොවින් ලබන වින්දනය ඒ සියල්ලට ම නොදෙවෙනි ය. ජයද්දිස සිටුවරයා සාමා වෙනත් අය සමග එකතුවනවාට කැමති නැත. ඔහු පතන්නේ සාමා තමාට ම අයත්විය යුතු බවයි.

"ඇත්ත කියනවානම් මම කැමති නෑ වෙන පිරිමින් සාමාව වැලඳගන්නවාට. මම කැමතියි ඔබ මටම අයිතියි කියලා හිතන්න."[8]

ධනය බලය කොපමණ තිබුණ ද ඔහුට මානසික තෘප්තියක් නැත. ගණිකාවක් තමන්ට ම අයිතිකර ගත්ත ද, ඇය බිරිඳක් කරගැනීමට ද ඔහු කැමති නැත. මිනිස් සමාජය එතරම් කුරිරු ය. අධම ය. තිරශ්චින ය. ඔහුට සාමා කෙළිබඩුවකි. ජීවිත මිල මුදලට ගැනීමටත් දීමටත් හැකි දෙයකි. මනුෂ්‍ය ජීවිතයක තත්ත්වය එයයි.

"මිළට මුදලට ගත නොහැකිදේ නැතැයි
මෙලොවේ සිතන මේ අය
මිළට ගෙන කය ගැහැණියකගේ
හදවතත් ඇගෙ ලබාගන්නට
බලති මසුරන් පියලි බැඳදී
ඉසුරු මදයෙන් මත් තැනැත්තෝ"[9]

මේ කුරිරු අධම ලෝකය ගැන සාමාට ඇත්තේ කළකිරීමකි. මෙතෙක් ගත කළ ගණිකා ජීවිතයෙන් මිදී, වලට වැදි තපසට යාමට ඇය තීරණය කරයි.

"මා සන්තකවූ වස්තුව මුළුල්ල මම යාචකයන්ට දී නොබෝ දවසකින් වලට වැද තපස් වඩා ඒ පිනින් මතු ජන්මයෙහි ස්වාමියෙකු ලැබ දූ පුතුන් වදා යෙහෙන් වෙසෙමියි ඉටාගත්තා ය.[10]

සාමා මෙසේ ජීවිතය ගැන කනස්සල්ලෙන් පසුවන විට මහ මඟ මං පහරණ මිනී මරණ සොර දෙවූ භාරිත රාජපුරුෂයන් විසින් විවිධ තාඩණ පීඩන කරමින් රථයක තබාගෙන සාමාගේ මන්දිරය සමීපයෙන් ද යයි. රාජ පුරුෂයෝ මග හමුවන හා නිවෙස්වල සිටින වෙනත් අයගෙන්

මෙන්ම ජනපදකල්‍යාණි සාමාගෙන් ද සමාව අයදින ලෙස හොරදෙටුට අණ කරති. ඔහු මතු මහල දෙස බලයි. විශාල පිරිසක් දෙපස රැඳී රැස්කකා මෙය නරඹති.

"මුවින් නොබැන හිස එසවූ සොරාගේ දසට ගොදුරු වූයේ තරුකැල පිරිවර කොට ගත් චන්ද්‍ර මණ්ඩලයක් මෙන් වණ්ණදාසීන් විසින් පිරිවරන ලදුව සඳලු තලයෙහි හුන් සාමාවගේ පැහැපත් මුහුණය." [11]

සොර දෙටු භාරිතගේ මුහුණ දුටු විගසම සාමාගේ හැසිරීම් රටාව වෙනස් වේ. ඇයට ඔහු කෙරෙහි දයාවක් කරුණාවක් අනුකම්පාවක් ඇති වේ. මෙතෙක් තමා හමු වීමට පැමිණි සිටුවරුන් රජවරුන් ආදී ධන කුවේරයන් කෙරෙහිවත් ඇති නොවුණු දයාවක් කරුණාවක් මේ හොර දෙටු භාරිත කෙරෙහි ඇති විය. එයයි සැබෑ මනුෂ්‍ය ස්වභාව ය. ජීවිතය යනු මුදල් හෝ මුදලට ගත හැකි දෙයක් හෝ නොවේ. මිණීමරු හොරදෙටුවා ඇගේ එකම පෙම්වතා ද, ජීවය ද විය. ඔහු කෙසේ හෝ යදමින් මුදා ගෙන තම ස්වාමි පුරුෂයා ලෙස පත්කර ගත යුතු ය. එයයි ඇගේ එක ම අදිටන ඇය දැන් ක්‍රියාත්මක වන්නී ය. ඇගේ නුවණින් දැන් ඵල ප්‍රයෝජන ගත යුතු ය.

ජයද්දිස සිටුවරයා මේ කාර්යය සඳහා යොදා ගන්නේ ඉතාමත් ම උපක්‍රමශීලිව ය. ඔහු ඇගේ උපායට හසුවෙයි. භාරිත තම එක ම මල්ලී බව හඟවා ඔහු බේරා ගැනීමට ඇය ක්‍රියාත්මක වන්නී ය.

"මගේ එකම සහෝදරයා, මම දන්නේ කොහොමද එයාට මෙහෙම දෙයක් වෙයි කියලා? අද රැයින් පස්සේ මට සහෝදරයෙක් නෑ මට මේ ලෝකේ කවුරුවත් නෑ එතකොට, යි කියමින් ඕ තොමෝ සිටාණන්ගේ ඇකයෙහි තම හිස හොවාගෙන වැලපෙන්නට පටන් ගත්තාය." [12]

සාමා කෙසේ හෝ ජය ගනී. ගැහැණුන්ගේ ඒ හැසිරීම ස්ථානෝචිත ය. කතුවරයා ඒ සඳහා සුදුසු ම වදන් සුදුසු ම ලෙස ගලපාගෙන ඇත. එකී අවස්ථාව පාඨක මනසෙහි චිත්‍රණය කිරීමට සමත් වී ඇත. මරණයට කැප වූ පල්හොරෙක් මුදල් බලයෙන් මරණයෙන් බේරෙයි. සිටුවරයා දිවි පුදා එය සිදු කරයි. සිටුවරයා සමග කෝපයෙන් සිටි ගුත්තසේනට මෙය කදිම අවස්ථාවක් විය. සිටුවරයෙකුගේ දිවිපුදා ආරක්ෂා කරන්නේ මිනීමරු පල් හොරෙකි. ඒ සියලු කැප කිරීම් සිදුකරන්නේ ගණිකාවකගේ කුට උපක්‍රමවලට අසුවීමෙනි. ඒ අනුව රජ අණට ද කළ නොහැකි දෑ ගණිකාවකට කළ හැකි ය. රටේ දේශපාලන වාතාවරනය එයයි.

පුරපති සිටුවරයාගෙන් පගාව ගනී. පගාව අල්ලස එදා මෙන් ම අද ද ඇත. රාජ්‍ය සේවකයෝ පගා කාරයෝ ය. සුළු කටයුත්තේ සිට මහ කටයුත්ත දක්වා පගා ගෙවිය යුතු ය. පුරපති පගා ගැනීම පමණක් නොව තම අඹුව ගෙදර සිටිය දී පරඹුවන්, ගණිකාවන් සරණ යයි. පුරපති ගුත්තසේන, භාරිත මුදාහරින්නේ සිටුවරයාගෙන් ලත් පගාවට නොව සාමා කෙරෙහි ඔහු තුළ ඇති දයාව, ප්‍රේමය, ආදරය පාදක කොටගෙන බව ලිඛිතව ඇයට දන්වීමට තරම් ගුත්තසේන දීන වේ.

කෙසේ හෝ හාරිත මරණයෙන් බේරාගෙන සාමා, තමන්ගේ ම කාමරයෙහි තබා ගෙන තුවාල සෝදා පවිත්‍රකොට අවංකව ම ඔහුට සත්කාර කරයි. සම්බුලා ජාතකයේ සොත්ථිසේනට ඇප උපස්ථාන කරන සම්බුලාවන් පරිද්දෙන් ඇය ද රෝගී හාරිතට සලකයි. රෝගී හාරිත සුවය ලබයි. හාරිත පල්හොරෙක් මිනීමරුවෙක් වශයෙන් මුළු රටම පිළිගත්ත ද සාමා එය පිළිගැනීමට සූදානම් නැත.

'කෙලෙස දෝ මොහු සොරකු වන්නේ
බැරිය මට අදහන්ඩ එපවත්
සිනාසෙනවිට ළදරුවෙකු සේ
අහිංසක සිත පෙනේ ඇතුළත
ද්වේෂ සහගත චේතනා නැත
හද පතුලේ සඟවා තබාගත්
මොහුහට උවටැන් කරමින් සිටියද
දිවිහිමි තෙක් සැනසීමකි එය මට
ගලවාගන්නාසේ ඔහු මරණින්
ගෙනයන්නෙමි ඔහු යහපත් මගකට
සැහැසිකමින් තොර දිවිපෙවෙතක් වෙත'[13]

සාමාගේ අරමුණ එයයි. උත්පත්තියෙන් ඔහු මිනීමරුවෙකු නොව අහිංසක දුප්පත් මවුපියන්ට දාව උපන් පුද්ගලයෙකි. ඔහු මිනීමරුවකු පල්හොරෙකු කළේ සමාජයයි. ඔහු හද තුළ පවිත්‍රත්වය මෙන්ම මනුෂ්‍යත්වයද ඇත. ඒවා යටපත්වී ඇත්තේ සමාජ බලවේග මගිනි. දුප්පත්කම, අසරණකම එකී මනුෂ්‍යත්වය පාගාගෙන වසාගෙන සිටියි. සෑම මනුෂ්‍යයෙකු ලඟම ඇති සැබෑ තත්ත්වය එයයි. උත්පත්තියෙන් කිසිවකු මිනීමරුවකු හෝ පල් හොරකුවීමට හෝ කිසිසේත් ම ඉඩ නැත. අහිංසක යැයි කියාගන්නා බොහෝදෙනා ළඟ ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, මානය, හැරෙන්නට අහිංසක කමත්, අවංක කමත් නැත. ඒවා ඇත්තේ මෙබඳු දුෂ්ඨයන් යැයි සැළකෙන අය ළඟ ය. යහපත අයහපත, හොඳ නරක උඩුයටිකුරු වී ඇත. රාජ්‍ය පාක්ෂිකයෝ එබඳු දුෂ්ඨයෝ ය. මිනීමරුවෝ ය. ජයද්දිස සිටුවරයා පුරපති මරන්නේ එබැවිනි.

ගණිකාවක්ව දිවි ගෙවන සාමා පතන්නේ අවංකව ම පතිව්‍රතාධර්මය ආරක්ෂා කරමින් සැබෑ පතිනියක්වීමට ය. ඇය හාරිත තෝරාගන්නේ එබැවිනි. ඇය සියළු සැප සම්පත් අතහැර දමා, දුර්භෝජන, දුක්ඛසෙය්‍යාවන් අනුභව කිරීමට සැබෑ සැමියෙකු සමග යෑමට සූදානම් ය.

ඇත්තෙන් ම ඇය සුරසැප අතහැර දමා හාරිත සමග ඈත පිටිසරබද පලාතකට පැන යන්නේ නිදහස ස්වාධීනත්වය පතා ය. ඇය මේ ගෙවන දිවියෙන් එවන් නිදහසක් ස්වාධීනත්වයක් සැබෑ ප්‍රේමයක් අපේක්ෂා කළ නොහැකි ය. ඇය හාරිත සමග පැන යන්නේ හුදෙක් කායික තෘප්තිය සඳහා ම නොවේ. මෙකී දුෂ්චරිත ජීවිතයෙන් අත්මිදී යහපත් බිරිඳක් වීමට ය. මාළිගා තුළ කොපමණ සැප සම්පත් තිබුණ ද ආත්ම තෘප්තියක් නැත. ඔවුන් දෙදෙනා වනයේ හොඳින් කල්ගෙවයි.

"වස්සවලාහක දෙවියෝ රොස් වී
කස සැමිට්ටිවලින් පියස්ස පැහැරී
විදුලි විහිදා ආලෝක සළා
පෙම්වතුන් දෙදෙනා උනුන් වැළඳ හුන්
ලෙස දක විළියෙන් සිනා සිසී යයි"[14]

මේ අන්දමින් අඹුසැමියන් ලෙස කල්ගත කිරීම කතුවරයා කලාත්මක පද්‍ය නිර්මාණයකින් කී අයුරු ළගන්නා සුළු ය. මේ අතර සාමාවෝ තමන්ගේ අතීත තොරතුරු හාරිතට කියයි. හාරිත සාමාව ගනිකාවක් බව දත ඇය කෙරෙහි අවිශ්වාසයක් ඇති කරගනී. හාරිත ද තමන්ගේ තොරතුරු සාමාට ප්‍රකාශකරයි. හාරිත මිනීමරුවෙක් බවට පත් වූවේ හුදෙක් ඔහුගේ වරදින් නොව තත්කාලීන සමාජ අසාධාරණය හේතු කොට ගෙනබව ඒ කථා පුවත් මගින් පාඨකයා අවබෝධ කරගනී. හාරිත පිළිබඳ සානුකම්පිත හැඟීමක් ඒ අනුව පාඨක මනසෙහි ගොඩනැගීමට කතුවරයා සමත් වේ. රාජ පුරුෂයන් විසින් දෙනලද වධ හිංසා නිසා හාරිත සැබෑ මංකොල්ල කරුවෙක් මිනීමරුවෙක් බවට පත්වෙයි.

සාමා රන්මසු දහසකට විකුණු නිසා ගණිකාවක් වූවා ය. මිනිසුන් සමාජ විරෝධී රාජ්‍ය විරෝධී කටයුතු කරන්නේ මිනිසුන්ගේ ඇති වරද නිසා නොව සමාජ ආර්ථික දේශපාලන හේතු නිසා බවත්, වැරදි සිදුවීම මනුෂ්‍ය ස්වභාවය බවත්, කතුවරයා ව්‍යංගයෙන් දක්වයි. කෙතරම් ආදරය කරුණාව දක්වුව ද එකාවන්ව එකට සිටිය ද ඇතැම්විට මිනිසුන්ගේ ස්වභාවික ගතිගුණ මතු වී ආ හැකි ය. එයයි, මනුෂ්‍යත්වයේ සැබෑ ස්වභාවය. තමන්ට ආදරයෙන් සැලකූ සාමා, මිගාචීර උද්‍යානයේ දී මරා ඇගේ මාල වළලු රැගෙන හාරිත පලායන්නේ ඒ මනුෂ්‍ය ස්වභාවයේ පවතින පොදු දුර්වලකම නිසා ය. එම දුර්වලකම් ගර්භාවට ලක් නොකට මැදිහත් සිතින් යුතුව විඳදරා ගත යුතු ය. සාමා එක සිතින් ම හාරිත සමග දිවි ගෙව්වා ය. ඇයට වෙනත් දිවියක් නැත.

"එකමගට පිළිපන් මෙවර අපි
කර්ම නියමය ලෙසට යළි
සසර ගමනේ කෙළවරට යමු
දෙහදවතට නොදී වියෝගිනී"[15]

ඇගේ පැතුම එය වුව ද "ජන්මෙට වඩා පුරුද්ද ලොකුයිනේ" කීවා සේ හාරිතට ඈ සමග හොඳින් සිටීමට නොහැකි විය. ඔහුට ඇයත් සමග ගතකළ දිවිය සිර ගෙයක් හා සමාන විය. ඔහු ඇගේ ගෙළ මිරිකා මරා පලායන්නේ එබැවිනි. එමෙන් ම ඔහුට ආදරය කරුණාව, මෛත්‍රීය, කිසිඳු ලැබී නැත. ඒවා ඔහුට හුරුපුරුදු ද නැත. හඳුනන්නේ ද නැත.

'ආදරය කියන එක කෙනෙකුගේ හිතේ බලයෙන්
ආරෝපණය කරන්නට පුළුවන් දෙයක් නොවේ.
ඒක ඉබේම හටගන්න ඕන ඒ කියන්නේ ,
කාවත් බෑ කෙනෙකුට ආදරය කරන්ට
තමාගේ හිත ඉඩ දුන්නොත් මිස එයා වෙනුවෙන්
ඔබ කොයි දේ කළත් එයාගේ හිතේ
ඔබ කෙරෙහි ආදරයක් උපන්නේ නෑ'[16]

යන සදාතනික සත්‍ය ලොවට හඬ ගා කියයි. අසාධාරණකම්, මිනීමැරුම්, මංකොල්ලකෑම්, රජකරණ සමාජයක අවංකත්වය ආදරය, ප්‍රේමය, සාධාරණත්වය කෙසේ නම් අපේක්ෂා කළ හැකිද? එය වූකලී මිරිඟුවකි.

'මායාවි ජීවිතයෙන් ගැලවී
අවංක ප්‍රේමය සොයමින් ගියාය
සාමානම් වරගන පෙර දවසේ
මිරිඟුවකියි එය වැටහුණි ඈ හට
ප්‍රේමය නම් අසෙනිය කුසුමක් වේ
රිසි වූ කෙනෙකුට පූජා කරන්නට
ලෝබ සිතින් තොර පිදුව මනාවේ
පෙරළා ලබන්නට නොසිතා බිඳකුත්'[17]

ඇය සිටි මායා ලෝකයෙන් මිදී සැබෑ ලෝකයට පැමිණියේ ආදරය ප්‍රේමය අපේක්ෂාවෙනි. නමුත් එය ද මායා ලෝකයක් විය. මිරිඟුවක් විය. ඇත්තෙන් ම සමාජය පස්පියුමින් සැදුම්ලත් විලෙකි. එකී විලතුළ ගල් මුල්, මඩ ගොහොරු එමටවත් ඇත. ඒවායෙන් මිදී ජලයෙන් ද මිදී පිපුණු නෙළුම් මලක් ඒ විල ද, අවට පරිසරය ද වර්ණවත් කරන්නේ, සුවඳවත් කරන්නේ යම්සේ ද මිනිසා ද එසේ සමාජයේ ඇති සියලු දෑ තේරුම්ගෙන කිසිම බන්ධනයකට යටත් නොවී පද්මයක් සේ විසිය යුතු බව මෙම විලාසිනියකගේ ප්‍රේමය තුළින් හෙළිකිරීමට සරච්චන්ද්‍රයන් ගත් උත්සහාය ප්‍රශස්ත. කටයුතු ය.

## සටහන්

01. කාව්‍යාදර්ශය (ප්‍රථම භාගය), ප්‍රේමරතන හිමි, වැලිවිටියේ, දේවානන්ද හිමි, හලගස්තොට, (සං) 1940, කොළඹ, 22, පිටුව.

02. සියබස්ලකර, ඥානසීහ හේන්පිටගෙදර, (සං), 2 පිටුව, 13 ගීය.

03. සරච්චන්ද්‍ර, එදිරිවීර, *විලාසිනියකගේ ප්‍රේමය*, 1988, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ. 16 පිටුව.

04. එම 18 පිටුව.

05. එම 19 පිටුව.

06. එම 19 පිටුව.

07. එම 21 පිටුව.

08. එම 26 පිටුව.

09. එම 28 පිටුව.

10. එම 31 පිටුව.

11. එම 38 පිටුව.

12. එම 45 පිටුව.

13. එම 56 පිටුව.

14. එම 74 පිටුව.

15. එම 81 පිටුව.

16. එම 118 පිටුව.

17. එම 119 පිටුව.